# II. ආර්ථික සහ මූල්‍ය උපනතීන්-1970

## (අ) ජාතික නිෂ්පාදිතය සහ වියදම

### (අ) සම්පිණ්ඩනය සහ අගැයීම

### දළ ජාතික නිෂ්පාදිතය

තාවකාලික ඇස්තමේන්තුවලට අනුව 1970 දී දළ ජාතික නිෂ්පාදිතය ස්ථාවර සාධක පිරිවැය මිල (1959) අනුව සියයට 4·1 කින් වැඩිවිය. මෙම වැඩිවීම 1969 මූර්ත වර්ධන අනුපාතිකය වූ සියයට 5·1 ට වඩා අඩුවූවද, 1960 1969 දක්වා දස වස තුළ ආර්ථිකය අත්දුටු සාමාන්‍ය වර්ධන අනුපාතිකය වූ සියයට 4·5 හා සතුටුදායක ලෙස සැසඳේ.

මූර්ත ආර්ථික වර්ධනයේ අංශවල සංයුතිය පිළිබඳ කෙරෙන විශ්ලේෂණය, කෘෂිකර්මයේ සහ සේවාවන්ගේ වැඩිවීමක් වූ අතර, තැනීම් කටයුතු සහ නිෂ්පාදන කර්මාන්තයන්ගේ නිමැවුම ඉහළ මට්ටමකින් පැවති බව පෙන්වයි. කෘෂිකර්මය, දැව කර්මාන්තය සහ ධීවර කර්මාන්තයේ නිමැවුම 1969 දී සියයට 0·9 හා සසඳන කල, 1970 දී සියයට 3·6 කින් වැඩිවිය. මෙම අංශයෙහි වී සහ අතිරේක ආහාර භෝග නිෂ්පාදනය සැළකිය යුතු වැඩිවීම් වාර්තා කළේය වසර අටක් තුළ අඩුම මට්ටමකට තේ නිෂ්පාදනය පහළ වැටුන අතර, පොල් නිෂ්පාදනය 1969 පැවති මට්ටමෙහිම පැවතියේය. රබර් සම්බන්ධයෙන් නිෂ්පාදනයෙහි වැඩිවීම සියයට 5·5 ක් විය. කෘෂිකාර්මික අංශයේ නිමැවුමේ වර්ධනය, දළ ජාතික නිෂ්පාදනයෙහිලා එහි සාපේක්ෂ කොටස නිසා සමස්ත ආර්ථික වර්ධනය කෙරේ විශාල බලපෑමක් ඇති කරයි. 1970 දී කෘෂිකර්මයේ සියයට 3·6 ක්වූ වැඩිවීමේ අනුපාතිකය නිෂ්පාදන කර්මාන්ත අංශයේ අනුපාතිකය පුළුල් වීමේ වේගය අඩුවීම හා පැවතියේය මෙම අංශයේ, අඩු වර්ධන වේගයට ප්‍රධාන හේතුව වූයේ අමු ද්‍රව්‍ය සැපයීමේ අඩුකමයි. තේ නිෂ්පාදන කර්මාන්තයේද පහත වැටීමක් විය. කෙසේ වුවද, රාජ්‍ය අංශයේ කාර්මික සංස්ථාවල නිමැවුම සැළකිය යුතු පරිදි ඉහළ ගියේය. තැනීම් කටයුතු අංශයේ සියයට 15·1 ක මූර්ත වැඩිවීමක් විය. මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ ගොඩනැගිලි උපකරණවල වඩා වැඩි සැපයුමයි. රජයේ, රාජ්‍ය සංස්ථාවල සහ පෞද්ගලික අංශයේ තැනීම් කටයුතු ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමක පැවතියේය.

**II (අ) 1 සංඛ්‍යා සටහන**

**ස්ථාවර (1959) සාධක පිරිවැය මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතයෙහි අංශික සැකැස්ම**

| අංශ | 1959 | | 1969 | | 1970 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | සියයට ගණන | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | සියයට ගණන |
| 1· කෘෂිකර්මය, දැව ඇ වන ද්‍රව්‍ය, දඩයම හා ධීවර කර්මාන්තය .. | 2,302 | 39·1 | 3,276 | 35·2 | 3,395 | 35·0 |
| 2· පතල් හා ගල් කැනීම .. | 31 | 0·5 | 55 | 0·6 | 65 | 0·7 |
| 3· නිෂ්පාදනය .. | 682 | 11·6 | 1,261 | 13·5 | 1,335 | 13·8 |
| 4· තැනීම් කටයුතු .. | 283 | 4·8 | 520 | 5·6 | 593 | 6·2 |
| 5· විදුලිය, ගෑස්, ජලය සහ සනීපාරක්ෂක සේවා .. | 10 | 0·2 | 18 | 0·2 | 21 | 0·2 |
| 6· ප්‍රවාහනය, ගබඩා කිරීම සහ පණිවුඩ හුවමාරුව .. | 541 | 9·2 | 899 | 9·7 | 913 | 9·4 |
| 7· තොග සහ සිල්ලර වෙළඳාම .. | 801 | 13·6 | 1,367 | 14·7 | 1,391 | 14·3 |
| 8· බැංකු ක්‍රමය, රක්ෂණ සහ නිශ්චල දේපල .. | 51 | 0·9 | 114 | 1·2 | 118 | 1·2 |
| 9· නිවාස අයිතිය .. | 201 | 3·4 | 291 | 3·1 | 302 | 3·1 |
| 10· රාජ්‍ය පරිපාලනය සහ ආරක්ෂාව .. | 301 | 5·1 | 445 | 4·8 | 459 | 4·7 |
| 11· සේවා .. | 728 | 12·3 | 1,139 | 12·2 | 1,184 | 12·2 |
| 12· දළ දේශීය නිෂ්පාදිතය .. | 5,930 | — | 9,384 | — | 9,781 | — |
| 13· විදේශිය ශුද්ධ සාධක ආදායම .. | – 37 | – 0·6 | – 66 | – 0·7 | – 85 | – 0·8 |
| 14· දළ ජාතික නිෂ්පාදිතය .. | 5,893 | 100·0 | 9,316 | 100·0 | 9,695 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෘෂිකර්මය සහ නිෂ්පාදන අංශයෙහි ආර්ථික ක්‍රියාවලියේ මට්ටම සේවා අංශයේ ක්‍රියාකාරිත්වයෙහි විශේෂයෙන් වෙළඳ සහ ප්‍රවාහණයෙහිලා පහත වැටෙන බලපෑමක් ඇති කළේය. වෙනත් තැනක නොසඳහන් සේවාවල නිමැවුමේ අගය 1970 දී සියයට 3.9 කින් වැඩිවිය. මෙම වැඩිවීම 1969 ට වඩා අඩුය. රජය මගින් සපයන ලද රාජ්‍ය පරිපාලන සහ සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවන්ගේ අගය 1970 දි සැළකිය යුතු පරිදි වැඩිවිය. එකිනෙක අංශයෙහි ප්‍රගතිය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් පසුව දක්වා ඇත.

1970 මූර්ත නිමැවුමේ වර්ධනය අගයීමේදී අපනයනවල, ආනයන ධාරිතාව වෙනස් කරනු ලබන නිසා වෙළඳ අනුපාතිකයෙහි වෙනස්වීම සැළකිල්ලට ගත යුතුවේ. 1970 දී ආනයන මිළ දර්ශකය සියයට 4.2 කින් වැඩිවූ අතර, අපනයන මිල දර්ශකය සියයට 0.4 කින් වැඩිවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ අනුපාතය සියයට 3.6 කින් අඩුවිය. ඒ අනුව මූර්ත නිමැවුම සියයට 4.1 කින් වැඩිවූ අතර, මූර්ත ජාතික ආදායම වැඩිවූයේ සියයට 3.4 කින් පමණි.

මූර්ත වැඩිවීම වන සියයට 4.1 හා සසඳන කල 1970 දී පවත්නා සාධක පිරිවැය මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සියයට 8.1 කින් වැඩිවිය.

1969 වැඩිවීමවූ සියයට 2.2 හා සසඳන කල 1970 දී ලංකාවේ මැදි වර්ෂ ජනගහනය දශලක්ෂ 12.5 ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, සියයට 2.1 ක වැඩිවීමකි. ඒකජන දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක මිල අනුව සියයට 5.8 කින් සහ මූර්ත වශයෙන් සියයට 2.0 කින් වැඩිවිය.

**සම්පත් සහ ඒවා උපයෝගී කර ගැනීම**

දේශීය නිෂ්පාදනය සහ වෙළඳ මිල අනුව ආනයනවලින් සංයුක්තව ආර්ථිකයට පැවති සම්පත්, 1970 දී රුපියල් දශලක්ෂ 14,288 සිට රුපියල් දශලක්ෂ 15,324 දක්වා සියයට 7.2 කින් වැඩිවිය. මෙය පරිභෝජනය මෙන්ම ප්‍රාග්ධන සම්පාදනය සහ නිර්යාත වැඩිවීමෙන් පිළිබිඹු කරයි. පවත්නා මිලයන්ගෙන් මණිනු ලැබූ කල, පරිභෝජනය සියයට 7.2 කින්ද, ප්‍රාග්ධන සම්පාදනය සියයට 10.6 කින්ද, නිර්යාත 4.0 කින්ද වැඩිවිය. කෙසේ වුවද, මූර්ත වශයෙන් සම්පත් සියයට 1.7 කින් වැඩිවූ බව ඇස්තමේන්තු කොට ඇති අතර, පරිභෝජනය සියයට 1.3 කින් ද ප්‍රාග්ධන සම්පාදනය සියයට 1.2 කින්ද වැඩිවිය.

1969 තත්ත්වය හා සලකන කල, 1970 දී සම්පත්වල වැඩිවීමට සම්පූර්ණයෙන්ම වාගේ හේතු වූයේ ආනයනය සියයට 11.5 කින් අඩුවී දේශීය නිෂ්පාදනයෙහි වැඩිවීමය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මුළු සම්පත්වලින් දළ දේශීය නිෂ්පාදිතයෙහි කොටස සියයට 81.7 සිට සියයට 83.1 දක්වා වැඩිවූ අතර, දළ දේශීය නිෂ්පාදිතය සඳහා ආනයන අනුපාතය සියයට 18.3 සිට සියයට 16.9 දක්වා පහත වැටුණි.

1970 ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ සුළු වැඩිවීමෙන් පිළිබිඹු වූයේ, ආනයන සැකැස්මේ වෙනස්වීමයි. මහ බැංකු ආනයන පරිමා දර්ශකයට අනුව, (1967 = 100) පරිභෝගික භාණ්ඩ පරිමාව 1970 දී 92.7 සිට 105.8 දක්වා වැඩිවූ අතර, ආයෝජන භාණ්ඩ පරිමාව 171.7 සිට 115.9 දක්වා සහ අන්තර් භාණ්ඩ පරිමාව 103.7 සිට 86.1 දක්වා පහත වැටුණි. 1969 සියයට 35.1 ක වැඩිවීම හා සසඳන කල 1970 දී දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 10.6 කින් වැඩිවිය. පාරිභෝජනයේ වැඩිවීම ප්‍රධාන වශයෙන් වූයේ ආහාර හා බීම සහ රෙදිපිළි වලය.

පාරිභෝජනය සහ ප්‍රාග්ධන සම්පාදනයෙන් යුක්තවූ මුළු ඉල්ලුම, දේශීය නිෂ්පාදනය සඳහා පැවති සම්පත්වලට වඩා වැඩිව පැවතුනා වූ උපනතිය ඉකුත් වාර්ෂික වාර්තාවල විදහා දක්වා ඇත. 1970 දීද, මෙම නැඹියාව පැවතියේය. 1969 සියයට 7.4 හා සසඳන කල 1970 දී දළ දේශීය වියදම සියයට 3.6 කින් දළ දේශීය නිෂ්පාදිතය ඉක්ම විය. ඉකුත් වර්ෂවලදී මෙන් මෙම හිඟයට මුහුණ දෙන ලද්දේ, විදේශ ගැනුම්වලින් සහ සංචිත වලින් හැර ගැනීමෙනි.

(ආ) නිෂ්පාදන උපනතීන්

කෘෂිකර්මය

තේ

1970 වේ තේ නිෂ්පාදනය රාත්තල් දශලක්ෂ 468 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය, රාත්තල් දශලක්ෂ 16 කින් හෝ සියයට 3·3 කින් 1969 ට වඩා අඩුය. මෙය 1962 සිට අඩුම නිෂ්පාදන මට්ටමයි. නිෂ්පාදනය රාත්තල් දශලක්ෂ 503 ක්ව පැවති 1965 සිට තේ නිෂ්පාදනය පහත වැටීමේ උපනතියක් පෙන්නුම් කර ඇත. උසස් මිලයන් සඳහා නිෂ්පාදකයන් නිෂ්පාදනය හැඩගැස්වීම නිෂ්පාදනයේ පහත වැටෙන උපනතියට ප්‍රධාන හේතුවයි. විශාල තේ වතු බොහොමයක්, වර්ගය සහ තේ මිල උසස් කර ගැනුම සඳහා වඩා උසස් තේ නෙළුම තෝරාගෙන ඇති බව වාර්තාවී ඇත. මීට අමතරව, තේ කොළ මිලදී ගන්නා කර්මාන්ත ශාලා, කුඩා වතු නිෂ්පාදනය යටපත් කිරීමේ අදහසින් උසස් වර්ගයේ කොළ සඳහා කැමැත්ත දක්වයි. මෑත වර්ෂවලදී, තේ වගාව සඳහා පොහොර ඉල්ලුම අඩුවීමද, තේ නිෂ්පාදනයේ පහත වැටෙන උපනතියට දයකවී ඇත. වසරේ සමහර කොටස්වලදී පැවති අයහපත් දේශගුණික තත්වයන්ගෙන්ද 1970 වේ නිෂ්පාදනයට බලපෑම් ඇති විය. 1969 රාත්තල් 845 හා සසඳන කල 1970 දී අක්කරයකට සාමාන්‍ය පලදාව රාත්තල් 811 ක් විය. 1970 දී තේ නිමැවුමේ පහත වැටීම උස් සහ මැදි බිම් තේ සම්බන්ධයෙන් වූ අතර, පහත් බිම් තේ වගා නිමැවුම ඉහළ ගියේය.

1970 වේ තේ වගාවට යටව පැවති අක්කර 597,499 න් අක්කර 576,800 ක් පළ දැරිය. නැවත වගාකළ වපසරිය අක්කර 40,286 කට ගෙන එමින්, 1970 දී අක්කර 6,858 ක එකතුවක් නැවත වගාකරන ලදී. නැවත වගා කිරීමේ ආධාර යෝජනා ක්‍රමය යටතේ ගෙවන ලද මුදල් ප්‍රමාණවත් නොවූයෙන් නැවත වගා කිරීමේ අතිරේක වියදම් පියවීම සඳහා තේ වතු වලට ණය දීමට තේ ආධාර අරමුදලින් මුදල්, රාජ්‍ය උකස් බැංකුවට සපයන ලදී. 1969 රුපියල් 13,000 හා සසඳන කල 1970 දී මෙම යෝජනා ක්‍රමය යටතේ රජයේ උකස් බැංකුව මගින් දුන් ණය මුදල් ප්‍රමාණය රුපියල් 161,000 ක් විය.

කර්මාන්ත ශාලා නවීකරණ යෝජනා ක්‍රම යටතේ දක්වන ලද සුළු දියුණුව නිසා රජය නවීකරණය සඳහා ලබාගත් බැංකු ණය මුදල්වලට ගෙවිය යුතු පොලියෙන්, අඩකට සම ආධාරයක් ගෙවීමට අමතරව, නවීකරණයේදී වන වියදම්වලින් තුනෙන් එකක දීමනාවක්ද ගෙවයි. මෙම යෝජනා ක්‍රම, නවීකරණයෙහි වේගය වැඩි කිරීමට තරමක් හේතුවූ බව පෙනේ. 1969 රුපියල් දශලක්ෂ 13·9 හා සසඳන කල 1970 දී කර්මාන්ත ශාලා නවීකරණ යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම් පත්‍ර වටිනාකම රුපියල් දශලක්ෂ 29·3 ක් විය. 1969 රුපියල් දශලක්ෂ 13·9 හා සසඳන කළ 1970 දී අනුමත කළ නියම ණය මුදල් රුපියල් දශලක්ෂ 8·96 ක් විය.

රබර්

1970 දී රබර් නිෂ්පාදනය රාත්තල් දශලක්ෂ 351 ක්වූ අතර රාත්තල් දශලක්ෂ 18 ක හෝ සියයට 5.4 ක වැඩිවීමක් විය. රබර් නිෂ්පාදනය වැඩිවීමට ප්‍රධානම හේතුව වූයේ, පල දැරීමට පටන් ගත් නැවත වගා කළ බිම් ප්‍රමාණයේ වැඩිවීමයි. රබර් වගාවට යටව පැවති අක්කර 568,900 න් අක්කර 496,210 ක් පල දැරිය. නැවත වගා කළ බිම් ප්‍රමාණයේ එකතුව අක්කර 286,340 කට හෝ මුළු අක්කර ප්‍රමාණයෙන් සියයට 50·3 කට හෝ ගෙන එමින් 1970 දී නැවත රබර් වගාකළ බිම් ප්‍රමාණය අක්කර 10,210 ක් විය. 1969 රාත්තල් 673 හා සසඳන කළ 1970 දී අක්කරයක සාමාන්‍ය පලදාව රාත්තල් 707 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

1969 රුපියල් දශලක්ෂ 16·6 හා සසඳන කළ 1970 දී රබර් නැවත වගා කිරීමේ යෝජනා ක්‍රමය යටතේ ගෙවන ලද මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 17·9 ක් විය.

1978 ජුනි 12



පොල්

සෘජු දත්තයන් නොමැතිවීම මධ්‍යයේ, පොල් නිෂ්පාදනය, නිර්යාත සහ දේශීය පරිභෝජනයේ ගෙඩි සමකයන් ලෙස ඇස්තමේන්තු කර ඇත. කුඩා වතු වැඩිවීමේ හේතුවෙන් වාර්ෂික පදනමක් මත නිෂ්පාදනයේ සෘජු ඇස්තමේන්තු ලබා ගැනීම කළ නොහැක්කකි. මහ බැංකුවේ, පොල් නිෂ්පාදන ඇස්තමේන්තුව ලබා ගනුයේ, අපනයනයන් ඒවායේ ගෙඩි සමකයන්ට හැරවීමෙන් සහ 1963 පාරිභෝගික මූල්‍ය සමීක්ෂණයේ දත්තයන්ගෙන් දේශීය පරිභෝජනය ඇස්තමේන්තු කිරීමෙනි. කෙසේ වුවද 1969 දී බැංකුව විසින් කරනලද විමර්ශයන්ගෙන් පෙන්නුම් කරනුයේ නිෂ්පාදනය 1968 මට්ටමෙහිම වාගේ පැවතුන බවයි. එමනිසා 1969 නිෂ්පාදනය සඳහා යොදා ගත් ඇස්තමේන්තු 1968 සඳහා වූවා මෙනි. කෙසේ වුවද, දේශීය පොල් පරිභෝජනයේ වැඩිවීම පිළිබඳව ස්ථිර සාක්ෂි නොමැති කමත්, 1969 දී සහ 1970 දී නිර්යාත ගෙඩි සමකයන් පහළ යාම නිසාත් මෙම ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කරන ලදී. එමනිසා පොල් නිෂ්පාදනයේ සංශෝධිත ඇස්තමේන්තුව 1969 දී ගෙඩි දශලක්ෂ 2,440 කි. එම පදනම යටතේම ඇස්තමේන්තු කළ 1970 පොල් නිෂ්පාදනය ගෙඩි දශලක්ෂ 2,447 කි. එය සියයට 0·3 ක වැඩිවීමකි.

පොහොර සහනාධාර යෝජනා ක්‍රමය සහ වැඩි පලදාවකින් යුතු පැල නිකුත් කිරීම සඳහා වන යෝජනා ක්‍රමයද 1970 දී තවදුරටත් ක්‍රියාත්මක විය. 1969 ටොන් 49,338 හා සසඳන කළ තාවකාලික ඇස්තමේන්තු අනුව පොහොර ටොන් 52,839 ක් නිකුත් කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ පොහොර නිකුත් කිරීමේ ඉලක්කය ටොන් 75,000 ක් විය. 1969 පැල 1,472, 159 හා සසඳන කළ වැඩි පලදාවක් ගෙනෙන පැල 1,534,313 ක එකතුවක් 1970 දී නිකුත් කරන ලදී.

වී

1970 වී නිෂ්පාදනය බුසල් දශලක්ෂ 76·8 ක් ඇස්තමේන්තු කර ඇති අතර, එය 1969 නිෂ්පාදනය හා සළකන කල, බුසල් දශලක්ෂ 10.9 ක හෝ සියයට 16.5 ක වැඩිවීමකි. 1969/70 මහ කන්නයේ වී නිෂ්පාදනය බුසල් දශලක්ෂ 49.5 ක් වූ අතර, එය 1968/69 මහ කන්නයේ නිෂ්පාදනය හා සලකන කල බුසල් දශලක්ෂ 2.5 ක හෝ සියයට 5·3 ක වැඩිවීමකි. 1970 යළ කන්නයේ නිෂ්පාදනය බුසල් දශලක්ෂ 27.4 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තුකර ඇති අතර, 1969 යළ කන්නයේ බුසල් දශලක්ෂ 18.9 හා සසඳන කළ බුසල් බුසල් දශලක්ෂ 8·5 ක හෙවත් සියයට 45·0 ක වැඩිවීමකි.

වී නිෂ්පාදනයේ වැඩිවීමට හේතු වූයේ, වගා කළ බිම් ප්‍රමාණයේ වැඩිවීම සහ වල් පැළ නෙලීම හා පැළ යලි සිටුවීම වැනි දියුණු වගා කිරීමේ පුරුදු ව්‍යාප්ත වීමේ හා උසස් වර්ගවල පොහොර හා බිත්තර වී ප්‍රයෝජනයට ගැනීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයයි.

1968/69 අක්කර දහස් 1,182 හා සසඳන කළ 1969/70 මහ කන්නයේ වගා කළ බිම් ප්‍රමාණය අක්කර දහස් 1,191 ක් විය. එය සියයට 0.8 ක වැඩිවීමකි. ප්‍රධාන වශයෙන් සතුටුදායක දේශගුණික තත්ත්වයන් නිසා 1970 යළ කන්නයේ වගාවට යට වූ බිම් ප්‍රමාණය සියයට 29.6 කින් අක්කර දහස් 527 සිට අක්කර දහස් 683 දක්වා වැඩි විය. 1968/69 මහ කන්නයේ බුසල් 51.2 හා සසඳන කළ 1969/70 මහ කන්නයේ අක්කරයකට සාමාන්‍ය ඵලදාව බුසල් 52.2 ක් වූ අතර 1969 යළ කන්නයේ 48.2 හා සසඳන කළ 1970 යළ කන්නයේ අක්කරයකට සාමාන්‍ය පළදාව බුසල් 49.5 ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නිකුත් කළ පොහොර ප්‍රමාණය 1969 ටොන් 84,718 සිට 1970 දී ටොන් 88,085 දක්වා වැඩි විය.

අතිරේක ආහාර බෝග

1970 දී අතිරේක ආහාර බෝගවල නිෂ්පාදනයේ වටිනාකම සියයට 26·4 කින් වැඩි විය. වැඩිවූ නිෂ්පාදනය කැපී පෙනුනේ ගම්මිරිස්, මිරිස්, අල සහ රතුළූණු සම්බන්ධයෙනි. අතිරේක ආහාර බෝගවල නිෂ්පාදනයේ වැඩිවීමට ප්‍රධාන හේතු වූයේ, ඉහල නිෂ්පාදන මිල මගින් සැපයූ අනුබලයන් සහ ණය පහසුකම්වල වැඩිවීමයි. 1969 හොණ්ඩරයකට රුපියල් 71·68 හා සසඳන කල, මිරිස්වල සාමාන්‍ය නිෂ්පාදක මිල හොණ්ඩරයකට රුපියල් 76·16ක්

විය. 1970 දී අල සම්බන්ධයෙන් සමානා නිෂ්පාදක මිල හොන්ඩරයකට රුපියල් 60·19 සිට රුපියල් 72·98 දක්වා වැඩි වූ අතර, ගම්මිරිස් 1969 දී හොන්ඩරය රුපියල් 227·30 සිට 1970 දී හොන්ඩරය රුපියල් 381·98 දක්වා වැඩි විය.

අතිරේක බෝග වගාවන් සඳහා දෙන ලද ණය මුදල් 1968/69 දී රුපියල් දශලක්ෂ 6.8 සිට 1969/70 දී රුපියල් දශලක්ෂ 7·9 දක්වා වැඩි විය. ණය මුදල් වැඩි වශයෙන් සපයන ලද්දේ මිරිස්, රතුළූණු සහ අල සඳහාය.

## නිෂ්පාදන කර්මාන්ත

නිෂ්පාදන කර්මාන්ත ක්‍රියාවලියේ වේගය හීනවීමක් 1970 දී විය මහ බැංකුව මගින් සකසන ලද ඇස්තමේන්තුවලට අනුව, 1969 වූ සියයට 16·2 ක වැඩිවීම හා සසඳන කල 1970 වේ කාර්මික නිෂ්පාදනයේ වැඩිවීම සියයට 8.4 කි. කෙසේ වෙතත්, රාජ්‍ය අංශයේ නිෂ්පාදන කර්මාන්ත සංස්ථාවල නිෂ්පාදන වටිනාකම සැළකියයුතු පරිදි වැඩි විය නිෂ්පාදන කර්මාන්ත අංශයේ වර්ධනය පිළිබඳව දීර්ඝ විග්‍රහයක් මෙම වාර්තාවේ ද්විතියක අංශයක දක්වා ඇත.

තාවකාලික ඇස්තමේන්තුවලට අනුව නිෂ්පාදන කර්මාන්තයෙහි එක් කළ වටිනාකම මූර්ත මිණුම් අනුව, 1969 සියයට 9·2 හා සසඳන කළ, සියයට 5·9 ක වැඩිවීමක් බව ඇස්තමේන්තු කර ඇත. 1969 සියයට 16·9 හා සසඳන කළ, නිෂ්පාදන කර්මාන්තයෙහි (තේ, රබර් සහ පොල් හැර) එක් කළ වටිනාකම 1970 දී සියයට 9·6 කින් වැඩි විය.

පෞද්ගලික අංශයේ නිෂ්පාදන කර්මාන්ත සමාගම්වල අඩු නිෂ්පාදන අනුපාතිකයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, අමු ද්‍රව්‍ය සැපයුමේ අඩුකමකි. වසරේ මුල් අර්ධයේදී, නිෂ්පාදකයන් අමු ද්‍රව්‍ය විශාල තොගයක් රැස් කළද, තොග අඩු වීමෙන් නිෂ්පාදනය වැඩිවීමේ සැළකිය යුතු ප්‍රමාණයක් පාලනය කළේය.

රාජ්‍ය අංශයේ නිෂ්පාදන කර්මාන්ත සංස්ථාවල නිමැවුම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, තම නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම, ධාරිතාව ප්‍රයෝජනයට ගැනීම වැඩි කිරීම සහ වඩා හොඳ පරිපාලනයයි. මුළු නිෂ්පාදන කර්මාන්ත නිමැවුමෙන් රාජ්‍ය අංශයේ සංස්ථා වල කොටස 1970 දී සියයට 31 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

කර්මාන්ත නිෂ්පාදනයේ නිමැවුම විශාල ලෙස වැඩි වූයේ, රසායනික, පෙට්‍රෝලියම් නිෂ්පාදන, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන සහ ආහාර ගණයෙහිය. මෙම අංශයේ උපනතීන්ගෙන් කැපී පෙනෙන ලක්ෂණය නම්, මුළු නිෂ්පාදන කර්මාන්ත නිමැවුමෙන් ආයෝජන හා අන්තර් භාණ්ඩ කොටස වැඩි වූ අතර, පාරිභෝගික භාණ්ඩවල කොටස අඩු වීමයි.

## තැනීම් කටයුතු

1970 දී තැනීම් කටයුතු පිළිබඳ ක්‍රියාවලිය ඉහළ මට්ටමක පැවතුණි. මූර්ත වියදම් අනුව 1969 වූ සියයට 16·5 ක වැඩිවීම හා සසඳන කල තැනීම් කටයුතුවල එක් කළ වටිනාකම සියයට 15·1 කින් වැඩි විය. තැනීම් කටයුතු ක්‍රියාවලියේ වැඩිවීම, පෞද්ගලික අංශය, රජය සහ රාජ්‍ය සංස්ථා අතර බෙදී ගියේය. 1970 තැනීම් කටයුතු ක්‍රියාවලියේ ඉහළ මට්ටමට හේතු වූයේ, ගොඩනැගිලි උපකරණවල වැඩි සැපයුම සහ නිවාස හා අනිකුත් තැනීම් කටයුතු සඳහා වැඩි වූ ඉල්ලුමත්ය. 1969 ටොන් 279,000 හා සසඳන කල, 1970 සිමෙන්ති නිෂ්පාදනය ටොන් 321,000 ක් විය. 1970 දී රාජ්‍ය සංස්ථාවල ගොඩනැගිලි සහ අනිකුත් තැනීම් කටයුතුවල වටිනාකම සියයට 11·0 කින් වැඩි වූ අතර, රාජ්‍ය අංශයේ තැනීම් කටයුතුද ඉහළ මට්ටමක පැවතුණි.

## සේවා

සේවා අංශයේ විශේෂයෙන්ම වෙළඳ සහ ගමනාගමනයෙහි ආර්ථික ක්‍රියාකාරිත්වය 1970 දී පහළ මට්ටමක පැවතුණි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 1969 හා සසඳන කල 1970 දී දේශීය නිෂ්පාදනයේ හා ආනයනවල මට්ටම භාණ්ඩ සැපයුමේ අඩුවීමකට මග පැදීමයි. 1970 දී තොග සහ සිල්ලර වෙළඳාමේ නිෂ්පාදන වටිනාකම සියයට 1.8 කින් සහ ගමනාගමන නිෂ්පාදන වටිනාකම සියයට 1.5 කින් වැඩි විය. ගමනාගමන අංශයෙහි සමස්ත වැඩිවීම සුළු වූවත්, ලංකා ගමනා ගමන මණ්ඩලය මගින් ප්‍රවාහණය කළ මගීන්ගේ සහ ලංකාණ්ඩුවේ දුම්රිය මගින් මෙහෙය වූ භාණ්ඩවල සැළකිය යුතු වැඩිවීමක් විය. 1970

දී ලංකා ගමනා ගමන මණ්ඩලය මගින්, මගීන් සැතපුම් ගණන සියයට 7.5 කින් වැඩි කෙළේය. රජය මගින් සපයන ලද සෞඛ්‍ය සහ අධ්‍යාපනික සේවාවල ද ව්‍යාප්ත වීමක් සිදු විය.

**(ඇ) මුළු සම්පත් ප්‍රමාණය හා ඒවා උපයෝගි කොට ගැනීම**

1968, 1969 හා 1970 දී ආර්ථිකයට ලබාගත හැකි වූ මුළු සම්පත් ප්‍රමාණය හා ඒවා- යේ උපයෝජන රටාව පහත දැක්වෙන සංඛ්‍යා සටහනෙන් පෙන්නුම් කරයි.

## II (අ) 2 වන සංඛ්‍යා සටහන

### මුළු සම්පත් ප්‍රමාණය හා ඒවා උපයෝගී කර ගත් ආකාරය

| ශීර්ෂ | 1968 | 1969 | 1970 | ගතවූ වර්ෂය හා සසඳන විට වෙනසෙහි ප්‍රතිශතකය | |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (රුපියල් දශලක්ෂ) | | | 1969 | 1970 |
| **අ. සම්පත්** | | | | | |
| දළ දේශීය නිෂ්පාදිතය .. | 10,318 | 11,409 | 12,775 | + 10·6 | + 12·0 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන .. | 2,474 | 2,879 | 2,549 | + 16·4 | – 11·5 |
| එකතුව .. | 12,791 | 14,288 | 15,324 | + 11·7 | + 7·2 |
| **ආ. උපයෝජනය** | | | | | |
| පරිභෝජනය .. | 8,958 | 9,884 | 10,595 | + 10·3 | + 7·2 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. | 1,668 | 2,253 | 2,492 | + 35·1 | + 10·6 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. | 2,165 | 2,152 | 2,237 | – 0·6 | + 4·0 |
| එකතුව .. | 12,791 | 14,288 | 15,324 | + 11·7 | + 7·2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය නිෂ්පාදිතයෙන් හා ආනයනයෙන් සමන්විත වූ මුළු සම්පත් ප්‍රමාණය 1970 දී සියයට 7·2 කින් ඉහළ ගියේය. ආනයන සියයට 11·5 කින් පහළ වැටෙද්දී සම්පත් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීමයි. දේශීය නිෂ්පාදිතයේ වැඩිවීම ප්‍රධාන වශයෙන්, තැනීම් සහ කැනීම්, පතල්, විදුලිබලය හා කෘෂිකර්මය ඇතුළු නිෂ්පාදිතයේ වර්ධනය නිසා වූවකි.

1970 දී ආනයන වටිනාකම සියයට 11·5 කින් පහළ වැටිණි. ආනයන සංයුතිය ගැන සලකන කල, පරිමා වශයෙන්; ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 32·5 කින් හා අන්තර් භාණ්ඩ ආනයනය සියයට 17·0 කින් පහළ වැටිණි. පරිභෝජන භාණ්ඩ පරිමාව, (විශේෂයෙන් ආහාර හා පාන ගණයේ) සියයට 15·2 න් ඉහළ ගොස් ඇත.

මූර්ත වශයෙන්, දේශීය නිෂ්පාදිතය සියයට 4·2 කින් ඉහළ ගොස් ඇති අතර, ආනයන වටිනාකම සියයට 14·1 න් පහළ වැටිණි.

සම්පත් උපයෝජනයේ විශ්ලේෂණයකින්, අපනයනයට කැප කළ සම්පත් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2152 සිට රුපියල් දශලක්ෂ 2237 දක්වා සියයට 4·0 කින් ඉහළ ගොස් ඇති බැව් පෙන්නුම් කරයි.

ප්‍රාග්ධන සම්පාදනය සඳහා යොදවන ලද සම්පත් ප්‍රමාණය, 1969 දී රුපියල් දශලක්ෂ 2,253 සිට 1970 දී රුපියල් දශලක්ෂ 2492 දක්වා සියයට 10·6 න් ඉහළ ගොස් ඇති අතර, පරිභෝජනය සඳහා කැප කරන ලද සම්පත් ප්‍රමාණය 1969 දී රුපියල් දශලක්ෂ 9,884 සිට 1970 දී රුපියල් දශලක්ෂ 10,595 දක්වා සියයට 7·2 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වුවත්, මූර්ත වශයෙන්, පරිභෝජනය සියයට 1·3 කින් ඉහළගොස් ඇති අතර, ප්‍රාග්ධන සම්පාදනය සියයට 1·2 කින් ඉහළ ගොස් තිබේ.

**(ඈ) පවත්නා සාධක පිරිවැය මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය.**

**පවත්නා මිල අනුව නිෂ්පාදිත වටිනාකම**

පවත්නා සාධක පිරිවැය මිල අනුව දළ ජාතික නිෂ්පාදිත ඇස්තමේන්තු, පරිශිෂ්ඨයේ 4 වැනි සංඛ්‍යා සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇත. 1968 සිට 1970 දක්වා වූ සංඛ්‍යා පහත දැක්වෙන සංඛ්‍යා සටහනෙහි සම්පිණ්ඩනයකර දක්වේ.

## II (අ) 3 වැනි සංඛ්‍යා සටහන

### පවත්නා සාධක පිරිවැය මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය

| අංශයන් | 1968 | 1969 | 1970 | ගතවූ වසරට වඩා වෙනසෙහි ප්‍රතිශත | |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (රුපියල් දශලක්ෂ) | | | 1969 | 1970 |
| 1· කෘෂි, වන, දඩයම් හා ධීවර .. .. | 3,656 | 3,732 | 3,949 | + 2·1 | + 5·8 |
| 2· නිම් කර්මාන්ත, පතල් හා කැනීම්, විදුලිබලය හා ගෑස් | 1,224 | 1,399 | 1,545 | + 14·3 | + 10·4 |
| 3· තැනීම් .. | 509 | 646 | 771 | + 26·9 | + 19·4 |
| 4· වෙළදාම, ප්‍රවාහන හා වෙනත් සේවා .. | 4,481 | 5,080 | 5,496 | + 13·4 | + 8·2 |
| 5· දළ දේශීය නිෂ්පාදිතය .. | 9,869 | 10,857 | 11,760 | + 10·0 | + 8·3 |
| 6· විදේශීය ශුද්ධ සාධක ආදයම් .. | − 61 | − 109 | − 142 | | |
| 7· දළ ජාතික නිෂ්පාදිතය .. | 9,809 | 10,748 | 11,618 | + 9·6 | + 8·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1969 දී සියයට 9·6 ක් හා සසඳන කල, පවත්නා සාධක පිරිවැය මිල අනුව 1970 දළ ජාතික නිෂ්පාදිතය සියයට 8·1 කින් ඉහළගොස් ඇති බවට තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. ගත වූ වර්ෂයන්හිදී මෙන් නොව, ද. ජා. නි. හි වැඩිවීම කිසියම් එක් අංශයක වර්ධනයක් ලෙස දක්වීමට හැකි නොවේ. පරිශිෂ්ඨයේ 4 වන සංඛ්‍යා සටහනෙන් පෙන්නුම් කෙරෙන පරිදි තැනීම් හා නිම් කර්මාන්ත නිමැවුම ඉහළ මට්ටමක පැවතෙද්දී, කෘෂිකර්ම හා සේවාවන්ගේ සාමාන්‍ය වර්ධනයක් සිදු වී ඇත. 1970, ද. ජා. නි. වර්ධනය මිල ඉහළ යාමත්, මූර්ත නිෂ්පාදිතය ඉහළ යාමත් නිසා වූවකි.

1969 දී සියයට 2·1 හා සසඳන කල, 1970 දී කෘෂි, වන හා ධීවර කටයුතුවල එකතු කළ වටිනාකම සියයට 5·8 කින් ඉහළ ගොස් ඇත. දේශීය කෘෂිකර්මයෙහි වී හා අතිරේක ආහාර භෝගවල විශාල වර්ධනයක් පිළිබිඹු කෙරුණි. 1969 බුසල් දශලක්ෂ 65·9 හා සසඳන කල, 1970 දී වී නිෂ්පාදිතය බුසල් දශලක්ෂ 76·8 ක් බවට ඇස්තමේන්තු කර ඇත. 1970 දී යල කන්නයේ ඉතාමත් සතුටුදායක අස්වැන්න මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 1970 අතිරේක ආහාර භෝග නිෂ්පාදිතයන්ගේ වටිනාකම සියයට 26·4 කින් ඉහළ ගොස් ඇත. විශාලතම වර්ධනයන් වූයේ අල, මිරිස්, රතුලූණු හා ගම්මිරිස් නිෂ්පාදනයෙහිය. අතිරේක ආහාර භෝගයන්ගේ එකතු කළ වටිනාකමද 1970 දී සියයට 26·4 කින් ඉහළ ගිය බවට ඇස්තමේන්තු කර තිබේ.

මෑත වර්ෂවල කෘෂිකර්මයෙහි වර්ධනය; ඉහල මිල විසින් ඇති කළ අනුබලය, දියුණු වගා ක්‍රම ව්‍යාප්තියෙහි සමුච්චිත බලපෑම හා ණය පහසුකම් සැපයීම නිසා සිදුවූවකි. 1969 සියයට 5·6 හා සසඳන කල, 1970 දී දේශීය කෘෂිකර්මයෙහි එකතු කළ වටිනාකම සියයට 9·1 න් ඉහළ ගිය බවට ආගණිත කර ඇත.

1969 දී අපනයන කෘෂිකර්මයෙහි සියයට 3·3 ක පහළ යාම හා සසඳන විට, 1970 දී සියයට 0·4 ක ඉහල යාමක් සිදු විය. තේ නිෂ්පාදිතය සියයට 3·3 කින් පහළ වැටුණත්, තේ අපනයනයන්හි පරිමාවේ හා සාමාන්‍ය මිලෙහි වර්ධනයක් සිදුවිණි. 1970 දී රබර් නිෂ්පාදිතය සියයට 5·5 කින් ඉහළ යාම, එහි මිලෙහි වූ පහළ වැටීම ඉක්මවීමට තරම් ප්‍රමාණවත් විය. 1970 පොල් නිෂ්පාදිතය 1969 ට වඩා ආන්තික වර්ධනයක් හා පොල් නිෂ්පාදිත තුනෙහිම මිල ගණන්වල වාර්තාගත වැඩිවීමක් සිදුවූයේය. අපනයන මිල දර්ශකයෙන් මනිනු ලැබූ කල, අපනයන මිල ගණන්වල සාමාන්‍ය මට්ටම 1970 දී සියයට 0·4 කින් ඉහළ ගොස් ඇත.

1970 දී නිමි කර්මාන්තයෙහි නිෂ්පාදිත අගය 1969 ට වඩා සියයට 10·4 කින් ඉහළ මට්ටමක විය. 1969 දී සියයට 22·9 ක වර්ධනය හා සසඳන කල, 1970 නිමි කර්මාන්තයන්හි එකතු කළ වටිනාකම (තේ, රබර් හා පොල් හැර) සියයට 14.7 කින් ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, කලින් සාකච්ඡා කළ පරිදි, මේ අංශයෙහි වැදගත් ලක්ෂණයක් වූයේ රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි වැඩෙන වැදගත්කමයි. රාජ්‍ය අංශයේ කාර්මික සමායතනයන්හි 1970 නිෂ්පාදිතයෙහි සැළකිය යුතු වර්ධනයක් වාර්තාගත කළේය. ඛනිජ තෙල් නිෂ්පාදිතයන්හි ඉතා ඉහළ මට්ටමක් දිස් වූ අතර, සිමෙන්ති නිෂ්පාදිතයෙහි විශාල වර්ධනයක් සිදුවිය. අමු ද්‍රව්‍ය සැපයීම සීමිත වීම නිසා, පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හි නිෂ්පාදන කාර්‍යයේ පහල වැටීමක් සිදු වී ඇත.

1969 දී සියයට 26·9 ක වර්ධනය හා සසඳන කල, 1970 දී තැනීම් කටයුතුවල එකතු කළ වටිනාකම සියයට 19·4 ක ඉහළ යාමක් විය. රාජ්‍ය සමායතනවල තැනීම් කටයුතුවල විශාල වර්ධනයක් දක්නට ලැබිණි. පදිංචිය සහ එසේ නොවූ තැනීම් කටයුතුවල ඉල්ලුමේ වැඩිවීම නිසා, පෞද්ගලික අංශයේ තැනීම් කටයුතු ද ඉහළ මට්ටමක පැවතිණි.

1970 දී සේවා අංශයේ එකතු කළ වටිනාකම සියයට 8·2 කින් ඉහළ ගොස් ඇත. 1970 දේශීය නිෂ්පාදනයේ සුළු මට්ටම හා ආනයන පහළ වැටීම නිසා, භාණ්ඩ සැපයුම අඩුවිය. 1970 සේවා අංශයේ කාර්‍යයන්හි පහළ මට්ටමක් ඇතිවීමට මේ සාධකය වගකිව යුතුය. කෙසේ වෙතත්, රජයෙන් සපයන ලද, සෞඛ්‍ය හා අධ්‍යාපන සේවාවල විශාල වර්ධනයක් දක්නට ලැබිණි.

1970 දී දළ දේශීය නිෂ්පාදිතය රුපියල් දශලක්ෂ 11,760 ක් ලෙස ආගණිත කර ඇති අතර, එය 1969 ට වඩා සියයට 8·3 ක ඉහළ යාමකි. 1969 දී රුපියල් දශලක්ෂ 109·0 ක් හා සසඳන කල, 1970 දී ලංකාවෙන් පිටතට ගලාගිය ශුද්ධ සාධක ආදයම් රුපියල් දශලක්ෂ 142·0 ක් විය. 1970 දී දේශීය නිෂ්පාදිතය, ශුද්ධ සාධක ආදයම් ගලා යාම හා ගැළපීමෙන් පසු ලබාගත් රුපියල් දශලක්ෂ 11,618 ක් වූ දළ ජාතික නිෂ්පාදිතය, 1969 ට වඩා සියයට 8·1 ක ඉහල යාමකි.

**(ඉ) මූර්ත නිෂ්පාදිතය හා මූර්ත ආදයම**

1968 සිට 1970 දක්වාවූ මූර්ත නිෂ්පාදිතයේ ඇස්තමේන්තු පහත දැක්වෙන සංඛ්‍යා සටහනෙහි සාරාංශ කොට දක්වා ඇත.

### II (අ) 4 වැනි සංඛ්‍යා සටහන

**දළ ජාතික නිෂ්පාදිතය (1959) සාධක පිරිවැය මිල අනුව**

| අංශයන් | 1968 | 1969 | 1970 | ඉකුත් වසරට වඩා ප්‍රතිශත වෙනස 1969 | 1970 |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (රු. ද. ල.) | | | | |
| 1· කෘෂි වන හා ධීවර .. | 3,248 | 3,276 | 3,395 | + 0·9 | + 3·6 |
| 2· නිමි කර්මාන්ත නිෂ්පාදනය, පතල් කැනීම, ගල් කැඩීම් හා විදුලිය, ගෑස් යනාදිය .. | 1,206 | 1,333 | 1,421 | +10·5 | + 6·6 |
| 3· තැනීම .. | 446 | 520 | 598 | +16·5 | +15·1 |
| 4· වෙළෙඳාම, ප්‍රවාහනය හා අනෙකුත් සේවා .. | 4,000 | 4,255 | 4,366 | + 6·4 | + 2·6 |
| 5· දළ දේශීය නිෂ්පාදිතය .. | 8,900 | 9,384 | 9,781 | + 5·4 | + 4·2 |
| 6· විදේශීය ශුද්ධ සාධක ආදායම .. | – 39 | – 68 | – 85 | | |
| 7· දළ ජාතික නිෂ්පාදිතය .. | 8,862 | 9,316 | 9,670 | + 5·1 | + 4·1 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ස්ථාවර (1959) සාධක පිරිවැය මිල අනුව 1970 දී දළ ජාතික නිෂ්පාදිතය සියයට 4·1 කින් වැඩිවිය. මෙම වැඩිවීම 1960–69 දශකය සඳහා සාමාන්‍ය වැඩිවීමේ අනුපාතිකයවූ සියයට 4·5 ට වඩා, සියයට 0·4 කින් අඩුවේ.

ස්ථාවර මිල අනුව 1970 වර්ෂයේදී කෘෂිකර්මය, කර්මාන්ත හා ධීවර කටයුතුවල නිමැවුමෙහිවූ වැඩිවීම· වන සියයට 3.6; 1969 සියයට 0·9 හා සැසඳේ. මෙම වැඩිවීම 1969 සංඛ්‍යාවන් හා සසඳන කල 1970 දී අපනයන කෘෂිකර්මයෙහි සුළු වැඩිවීමක්ද විශේෂයෙන් වී නිෂ්පාදනය ඇතුළත්වූ දේශීය කෘෂිකර්මයෙහි ඊට වඩා වැඩිවීමක් මගින්ද සමන්විත වේ.

නිමි කර්මාන්ත, පතල් කැනීම, ගල් කැඩීම, විදුලිය හා ගෑස් යනාදි කටයුතුවල, මූර්ත නිමැවුම සියයට 6·6 කින් වැඩිවිය. පොදු අංශයේ නිෂ්පාදන සංස්ථාවන්හිත් පෞද්ගලික අංශයේ නිමැවුම් ආයතනවලත් යන දෙකොටසෙහිම මූර්ත නිමැවුම වැඩිවීමක් පෙන්නුම් කළේය. විදුලිබල නිෂ්පාදනයෙහි සියයට 25·9 ක ඉහළ යාමක් දිස්විය.

1970 දී තැනිම් කටයුතුවල මූර්ත වටිනාකම සියයට 15·1 වැඩිවීමක් පෙන්නුම් කළේය. රජයේ, රජයේ සංස්ථාවල හා පෞද්ගලික අංශයේ තැනීම් කටයුතු ඉහළ මට්ටමක විය. රජයේ තැනීම් කටයුතු ප්‍රධාන කොට කෘෂිකර්මාන්තයෙහිවූ අතර, රාජ්‍ය සංස්ථාවන් තැනීම් කටයුතුවල නිරත විය.

ඉකුත් වර්ෂය හා සසඳන විට 1970 වර්ෂයේ දී නිමි හා තැනීම් කටයුතු පහළ මට්ටමක වීමත්, ආනයන ප්‍රමාණය අඩුවීමත් මගින් සේවා අංශයෙහි මූර්ත නිමැවුමෙහි වැඩිවීම සියයට 2·6 කට සීමා වූ අතර මෙය 1969 එම අංශයේ වැඩිවීම වූ සියයට 6·4 ක් හා සැසඳේ. කෙසේවුවද, මෙම සේවාවන්හි පුළුල්වීමක් නිසා අධ්‍යාපනය හා සෞඛ්‍ය කටයුතුවල මූර්ත නිමැවුම සැහෙන ප්‍රමාණයකින් ඉහළ ගියේය.

1970 දී දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිල අනුව සියයට 4·2 කින් ඉහළ ගිය අතර, මෙය 1969 දිස් වූ සියයට 5·4 වැඩිවීම හා සැසඳේ. ලංකාවෙන් විදේශයනට ගලා ගිය ශුද්ධ සාධක ආදායම් හා ගැළපීමෙන් පසු ලබා ගන්නා දළ ජාතික නිෂ්පාදිතය ස්ථාවර මිල අනුව 1970 දී සියයට 4·1 කින් වැඩි වූ අතර මෙය 1969 අනුරූපී සියයට 5·1 ක් හා සැසඳෙයි.

ජාතික ආදායම් මට්ටම සම්බන්ධව ආනයන හා අපනයන වටිනාකම් දරන්නාවූ වැදගත්කම නිසා දළ ජාතික නිෂ්පාදිතය පිළිබඳ ඇස්තමේන්තු, ආනයන හා අපනයන මිල චලනයන් අනුව සකස් කළ යුතුය. 1970 දී ලංකාවේ වෙළෙඳ අනුපාතය සියයට 3·6 කින් පහළ ගියේය. මෙම වර්ෂයේ දී ආනයන මිල සියයට 4·2 කින් වැඩි වූ නමුත් ලංකා අපනයන සඳහා ලැබූ මිල වැඩිවූයේ සියයට 0·4 කින් පමණි. ආනයන හා අපනයන මිල පිළිබඳ මහ බැංකුවේ දර්ශකයට (1967 = 100) අනුව මුළු ආනයන මිල දර්ශකය 1969 දී 133·9 සිට 1970 දී 139·6 දක්වා ඉහළ ගිය අතර මුළු අපනයන මිල දර්ශකය 1969 දී 117·3 සිට 1970 දී 117·8 දක්වා ඉහළ ගියේය. ලංකාවේ වෙළෙඳ අනුපාතය අවාසි සහගත ලෙස චලනය වීමේ හේතුවෙන් අහිමිවූ ආදායම් ප්‍රමාණය (1959 පදනම ලෙස ගණන් බැලූ කල) 1970 දී රුපියල් දශ ලක්ෂ 903 ලෙසත් 1969 දී රුපියල් දශ ලක්ෂ 814 ලෙසත් ඇස්තමේන්තු කර තිබේ. වෙළෙඳ අනුපාතයේ අවාසි සහගත චලනයන් නිසා අහිමිවූ ආදායම් අනුව මූර්ත නිෂ්පාදිතය ගැළපීමෙන් ලබා ගන්නා මූර්ත ජාතික ආදායම 1970 දී රුපියල් දශ ලක්ෂ 8793 ලෙස ඇස්තමේන්තු වන අතර මෙය 1969 සඳහා ඇස්තමේන්තුගත රුපියල් දශ ලක්ෂ 8503 හා සැසඳේ.

**(ඊ) දළ ජාතික වියදම**

ලංකාවේ දළ ජාතික වියදම පිළිබඳ වූ විස්තරාත්මක ඇස්තමේන්තු පරිශිෂ්ඨයෙහි 8 වෙනි සංඛ්‍යා සටහනින් දක්වා ඇත. පහත දක්වා ඇති සංඛ්‍යා සටහනෙහි 1968 සිට 1970 දක්වා දළ ජාතික වියදමෙහි ප්‍රධාන සංයුතීන් හා ඒවායේ වෙනස්වීම් සාරාංශ කොට දැක්වේ.

## II (අ) 5 වැනි සංඛ්‍යා සටහන

### දළ ජාතික වියදම – පවත්නා වෙළෙඳ මිල අනුව

| ශීර්ෂ | 1968 | 1969 | 1970 | ඉකුත් වසර හා සසඳන විට සියයට වෙනස 1969 | 1970 |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපි: දශ ලක්ෂ | | | | |
| 1· පෞද්ගලික පරිභෝජනය .. | 7,550 | 8,412 | 8,946 | +11·4 | + 6·3 |
| 2· රජයේ පරිභෝජනය .. | 1,408 | 1,471 | 1,649 | + 4·5 | +12·1 |
| 3· දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. | 1,668 | 2,253 | 2,492 | +35·1 | +10·6 |
| 4· දළ දේශීය වියදම .. | 10,626 | 12,137 | 13,086 | +14·2 | + 7·8 |
| 5· විදේශීය ශුද්ධ ආයෝජනය .. | – 346 | – 797 | – 393 | | |
| 6· ජාත්‍යන්තර ත්‍යාග වලින් සහ සංක්‍රාම වලින් ශුද්ධ ලැබීම් අඩු කොට .. | – 23 | – 39 | – 60 | | |
| 7· දළ ජාතික වියදම | 10,257 | 11,300 | 12,633 | +10·2 | +11·8 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංශෝධිත ඇස්තමේන්තුවලට අනුව 1969 දී දළ ජාතික වියදම රුපියල් දශ ලක්ෂ 11,300 ක් ලෙස ඇස්තමේන්තුගතවූ අතර මෙය සියයට 10·2 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. 1970 දී දළ ජාතික වියදම රුපියල් දශ ලක්ෂ 12,633·0 ලෙස ඇස්තමේන්තු වී ඇති අතර මෙය 1969 දී ට වඩා සියයට 11·8 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. 1970 දී දළ ජාතික වියදමෙහි දිස්වූ වැඩිවීම පරිභෝජනයෙහි වැඩීමක් හා ප්‍රාග්ධන සම්පාදනයෙහි වැඩීමත් යන දෙකම පෙන්නුම් කළේය. මෙම වර්ෂයේදී පරිභෝජනය සියයට 7·2 කිනුත් ප්‍රාග්ධන සම්පාදනය සියයට 10·6 කිනුත් වැඩිවිය.

**පාරිභෝගික ඉල්ලුම**

1970 දී පෞද්ගලික පරිභෝජන වියදම රුපියල් දශ ලක්ෂ 533 කින් හෙවත් සියයට 6·3 කින් වැඩිවිය. පරිභෝජන වියදමෙහි අනු කොටස් කිරීමක් මගින් පෙනෙන පරිදි දේශීය නිෂ්පාදිත භාණ්ඩ සඳහා වියදම සියයට 11·6 කින් වැඩිවූ අතර, ආනයන සඳහා වියදම සියයට 6·3 කින් අඩු විය. 1969 දී මෙම වියදම් පිළිවෙලින් සියයට 10·4 කින් හා සියයට 32·5 කින් වැඩිවිය. පරිශිෂ්ටයෙහි 10 වැනි සංඛ්‍යා සටහනින් මේ පිළිබඳ විස්තරාත්මක තොරතුරු සැපයේ.

## II (අ) 6 වැනි සංඛ්‍යා සටහන

### පවත්නා වෙළඳ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදම් සංයුතිය

| ශීර්ෂ | 1969 | | 1970 | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපි. දශලක්ෂ | එකතුවෙන් % ගණන | ප්‍රමාණය රුපි. දශලක්ෂ | එකතුවෙන් % ගණන |
| 1· ආහාර .. .. | 4,373 | 52·0 | 4,658 | 52·1 |
| 2· පාන වර්ග .. .. | 330 | 3·9 | 357 | 4·0 |
| 3· දුම්කොළ .. .. | 400 | 4·8 | 412 | 4·6 |
| 4· රෙදි පිළි හා අනෙකුත් පෞද්ගලික ද: .. .. | 736 | 8·8 | 818 | 9·1 |
| 5· කුලී හා ජලය සඳහා ගාස්තු .. .. | 387 | 4·6 | 398 | 4·4 |
| 6· ඉන්ධන හා එළිය .. .. | 200 | 2·4 | 212 | 2·4 |
| 7· ගෘහභාණ්ඩ, කිර රෙදි යනාදිය .. .. | 198 | 2·3 | 230 | 2·6 |
| 8· ගෙදර දොර කටයුතු .. .. | 507 | 6·0 | 554 | 6·2 |
| 9· සනීපාරක්ෂාව සහ සෞඛ්‍ය වියදම් .. .. | 223 | 2·6 | 215 | 2·4 |
| 10· ප්‍රවාහනය සහ පණිවුඩ හුවමාරුව .. .. | 779 | 9·3 | 813 | 9·1 |
| 11· විනෝද හා සම්භාෂණ .. .. | 387 | 4·6 | 439 | 4·9 |
| 12· විවිධ සේවා .. .. | 333 | 4·0 | 323 | 3·6 |
| 13· පිටරට පදිංචි කරුවන්ගේ වියදම් .. .. | 35 | 0·4 | 31 | 0·3 |
| 14· නේවාසික නොවන්නන්ගේ වියදම් අත්හැර .. | – 299 | – 3·6 | – 280 | – 3·1 |
| 15· රජයේ දේශීය මිලදී ගැනීම් අත්හැර .. | – 177 | – 2·1 | – 234 | – 2·6 |
| 16· ගෘහස්ථ සහ ලාබ නොලපයන පෞද්ගලික ආයතනයන්හි පරිභෝජන වියදම .. .. | 8,412 | 100·0 | 8,946 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1969 හා 1970 වර්ෂ සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදමෙහි සංයුතිය ඉහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. දක්නට ඇති පරිදි පරිභෝගික වියදම් රටාවේ වැදගත් වෙනසක් පසුගිය වර්ෂ තුනක කාලය තුළ සිදුවී නැත. 1970 දී පරිභෝගික වියදමින් සියයට 60·7 ක් ආහාර, පාන වර්ග හා දුම්කොළ සඳහාත්, සියයට 11·7 ක් රෙදිපිළි, ගෘහ භාණ්ඩ හා අනිකුත් පෞද්ගලික දෑ සඳහාත්, සියයට 9·1 ක් ප්‍රවාහනය සහ පණිවුඩ හුවමාරුව සඳහාත්, සියයට 4·4 ක් කුලී හා ගාස්තු සඳහාත්, සියයට 2·4 ක් ඉන්ධන හා එළිය සඳහාත්, සියයට 11·7 විනෝද, සම්භාෂණ වෙනත් පෞද්ගලික සේවා වියදම් සඳහාත් විය.

1970 දී පෞද්ගලික පරිභෝජන වියදමෙහි වැඩිවීම වූ රුපියල් දශ ලක්ෂ 533 පහත දැක්වෙන පරිදි බෙදී ගියේය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ සඳහා සියයට 56·8; රෙදිපිළි සඳහා සියයට 14·4; ප්‍රවාහනය හා පණිවුඩ හුවමාරුව සඳහා සියයට 5·9; විනෝද, සම්භාෂණ හා අනිකුත් සේවාවන් සඳහා සියයට 7·3 යනුවෙනි.

### දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය

දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ ඇස්තමේන්තු 7 වැනි පරිශිෂ්ඨ සංඛ්‍යා සටහනේ දක්වා ඇත. 1970 දී දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රුපියල් දශ ලක්ෂ 79 කින් හෙවත් සියයට 3·5 කින් ඉහළ ගියේය. රාජ්‍ය අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙහි සියයට 1·1 ක වැඩිවීමක් විය. මෙය වත්මන් ඇස්තමේන්තුවල ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධන වියදම රාජ්‍ය සංස්ථා අංශයට මාරු කිරීමෙන් ප්‍රධාන වශයෙන් පිළිබිඹු වෙයි. එම නිසා 1970 දී රජයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තුව 1969 හා නොවක්ව සැසඳිය නොහැකිය. රාජ්‍ය අංශයේ සංස්ථාවල ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රුපියල් දශ ලක්ෂ 125·0 කින් පහළ වැටුණි. පෞද්ගලික අංශයේ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය රුපියල් දශ ලක්ෂ 198 කින් හෝ සියයට 17·2 කින් 1970 දී ඉහළ ගියේය.

### රාජ්‍ය අංශය

1969 සහ 1970 අතරතුරදී රාජ්‍ය අංශයේ මුළු ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 1.1 කින් ඉහළ ගියේය. පහත දැක්වෙන සටහන රජයේ ප්‍රාග්ධන සම්පාදනය ප්‍රධාන කාර්මික ගණ අනුව වර්ගීකරණය කොට දක්වයි.

## II (අ) 7 වැනි සටහන

## රජයේ[1] ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙහි කාර්මික වර්ගීකරණය

| අංශ | 1969 | | 1970 | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය රු. දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතය | ප්‍රමාණය රු. දශලක්ෂ | එකතුවෙහි ප්‍රතිශතය |
| 1. කෘෂි, දව සහ ධීවර කර්මාන්තය .. .. | 193 | 34·2 | 181 | 31·8 |
| 2. නිමැවුම් කර්මාන්ත .. .. | 5 | 0·8 | 9 | 1·5 |
| 3. විදුලි බලය, ගෑස්, ජලය සහ සෞඛ්‍ය සේවාවන් .. .. | 114 | 20·1 | 40 | 7·1 |
| 4. ප්‍රවාහන, ගබඩාකිරීම සහ පණිවිඩ හුවමාරු . | 159 | 28·2 | 168 | 29·9 |
| 5. නිවාස අයිතිය .. .. | 1 | 0·2 | 5 | 0·9 |
| 6. රාජ්‍ය පරිපාලනය .. .. | 30 | 5·3 | 62 | 10·8 |
| 7. සේවා .. .. | 63 | 11·2 | 105 | 18·4 |
| එකතුව .. .. | 564 | 100·0 | 570 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1. පළාත් පාලන ආයතන ඇතුලත්ය.

1970 දී මුළු ආයෝජනයෙන් සියයට 31·8 ක් කෘෂිකර්මය, දුව කර්මාන්තය හා ධීවර කර්මාන්තයෙහිද, සියයට 29·9 ක් ප්‍රවාහනය, ගබඩා කිරීම හා පණිවුඩ හුවමාරුවෙහිද විය. 1969 සියයට 62·4 හා සසඳන කල මෙය රජයේ ආයෝජනවලින් සියයට 61·7 ක මුළු එකතුවකි. ඉතිරියෙන් සියයට 7·1 ක් විදුලිය, ජලය හා සනීපාරක්ෂක සේවාවලද, සියයට 10·8 ක් රාජ්‍ය පරිපාලනයෙහිද, සියයට 18·4 ක් සේවාවලද විය.

**රාජ්‍ය සංස්ථා**

රාජ්‍ය සංස්ථාවන්හි ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය කාර්මික ගණ අනුව ව්‍යාප්තිය II (අ) 8 වෙනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. රාජ්‍ය සංස්ථාවල ආයෝජනය 1969 රුපියල් දශලක්ෂ 563 සිට 1970 දී රුපියල් දශලක්ෂ 438 දක්වා සියයට 22·2 ක පහළ වැටීමක් පෙනේ.

### II (අ) 8 සංඛ්‍යා සටහන

### රාජ්‍ය සංස්ථාවල ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය – කාර්මික ගණ අනුව

| අංශ | 1968 | | 1969 | | 1970 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවෙන් සියයට | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවෙන් සියයට | ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ | එකතුවෙන් සියයට |
| 1· කෘෂිකර්මය .. | 64 | 23·0 | 75 | 12·5 | 89 | 20·2 |
| 2· නිමි කර්මාන්ත .. | 117 | 42·0 | 223 | 39·6 | 267 | 61·1 |
| 3· ප්‍රවාහනය .. | 19 | 7·0 | 72 | 12·9 | 56 | 12·7 |
| 4· වෙළඳාම .. | 64 | 23·0 | 173 | 31·8 | 18 | 4·0 |
| 5· සේවා .. | 14 | 5·0 | 189 | 3·2 | 9 | 1·9 |
| එකතුව .. | 278 | 100·0 | 562·6 | 100·0 | 437·6 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: 1· ප්‍රශ්නාවලියකට පිළිතුරු වශයෙන් සංස්ථාව විසින් සපයන ලද සංඛ්‍යා තොරතුරු වලින් සහ එම සංස්ථා විසින් ඒවායේ වාර්ෂික වාර්තාවල හා ගිණුම්හි දක්වා ඇති විස්තර වලින් රජයේ සංස්ථාවල ප්‍රාග්ධන සම්පාදනය ඇස්තමේන්තු කර ඇත.

2· සංස්ථා කීපයක ගිණුම් වර්ෂයන් හා ලිත් වර්ෂයන් එකිනෙකට නොසැසඳේ. මෙවැනි අවස්ථාවන්හි දී සංස්ථාවල ගිණුම් වර්ෂයෙන් සමසකට වැඩි කාලයක් ලිත් වර්ෂයට ගැනෙන විට ලිත් වර්ෂයට ගිණුම් වර්ෂයේ ඇස්තමේන්තු සියල්ල ඇතුළත් කර ඇත.

ප්‍රතිශෝධිත ඇස්තමේන්තු අනුව 1969 දී රාජ්‍ය සංස්ථාවල ප්‍රාග්ධන සම්පාදනය සියයට 102·5 කින් වැඩිවිය. 1969 ප්‍රතිශෝධිත ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තුවල අධික වැඩිවීමට ප්‍රධාන හේතු වූයේ, ලංකා ඛණිජ තෙල් සංස්ථාවේ රුපියල් දශලක්ෂ 173 ක සහ ජාතික පේෂ කර්ම සංස්ථාවේ රුපියල් දශලක්ෂ 56 ක ප්‍රාග්ධන වියදම වැඩිවීමය. මෙම සංඛ්‍යා ලේඛන 1969 ඇස්තමේන්තු සඳහා ඇතුළු කිරීමට නොපැවතිණ. කාර්මික ගණ අනුව රාජ්‍ය අංශයේ සංස්ථාවල ආයෝජන රටාව රජයේ ආයෝජන රටාවට වඩා වෙනසක් දක්වේ. ඉහත දක්වෙන පරිදි, රාජ්‍ය අංශයේ ආයෝජනයෙන් සියයට 31·8 ක් කෘෂිකර්මයේ සහ සියයට 29·9ක් ප්‍රවාහනය හා හුවමාරුවෙහි විය. රාජ්‍ය අංශයේ සංස්ථාවන්හි ආයෝජනයෙන් සියයට 61·1 ක් නිමිකර්මාන්ත යෙහිද, සියයට 20·2ක් කෘෂිකර්මයේ සහ සියයට 12·7 ක් ප්‍රවාහණයෙහි ද විය.

පහත දක්වෙන සංඛ්‍යා සටහන රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශයේ ආයෝජන ව්‍යාප්තිය වත්කම් වර්ගය අනුව පෙන්වයි.

## II (අ) 9 වැනි සංඛ්‍යා සටහන

### වත්කම් වර්ග අනුව රාජ්‍ය සංස්ථාවන්හි ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය

| වත්කම් වර්ගය | 1969 | | | | 1970 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | රාජ්‍ය සංස්ථාවන් | | පුද්ගලික අංශය | | රාජ්‍ය සංස්ථාවන් | | පුද්ගලික අංශය | |
| | ප්‍රමාණය රු. ද. ල. | එකතුවෙහි සියයට ගණන | ප්‍රමාණය රු. ද. ල. | එකතුවෙහි සියයට ගණන | ප්‍රමාණය රු. ද. ල. | එකතුවෙහි සියයට ගණන | ප්‍රමාණය රු. ද. ල. | එකතුවෙහි සියයට ගණන |
| වැවිලි හා ඉඩම් සංවර්ධන .. | 17 | 3·0 | 78 | 6·8 | 32 | 7·3 | 82 | 6·1 |
| ගොඩනැගිලි සහ අනෙකුත් තැනීම් කටයුතු .. | 139 | 24·7 | 674 | 58·7 | 154 | 35·2 | 814 | 60·4 |
| යන්ත්‍රාගාර සහ යන්ත්‍රසූත්‍ර .. | 318 | 56·5 | 62 | 5·4 | 176 | 40·3 | 146 | 10·8 |
| ප්‍රවාහන උපකරණ .. | 75 | 13·3 | 250 | 21·7 | 57 | 13·1 | 187 | 13·9 |
| අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ .. | 14 | 2·6 | 86 | 7·5 | 18 | 4·1 | 118 | 8·8 |
| එකතුව .. | 563 | 100·0 | 1,149 | 100·0 | 438 | 100·0 | 1,347 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන්: (1) ප්‍රශ්නාවලියකට පිළිතුරු වශයෙන් සංස්ථාවන් මගින් සපයන ලද සංඛ්‍යා තොරතුරු වලින් සහ ඒවායේ වාර්ෂික වාර්තා ගිණුම්වල දී ඇති විස්තරවලින් රජයේ සංස්ථාවල ප්‍රාග්ධන සම්පාදනය ඇස්තමේන්තු කොට ඇත.

(2) සංස්ථා කීපයකම ගිණුම් වර්ෂයන් හා ලිත් වර්ෂය එකිනෙකට නොසැසඳේ. එවැනි අවස්ථාවලදී සමසකට වඩා වැඩි කාලයක් ගැනෙන ලිත් වර්ෂයට ගිණුම් වර්ෂයේ ඇස්තමේන්තු සියල්ලම සම්පූර්ණයෙන්ම ඇතුළත් කර ඇත.

1970, රාජ්‍ය සංස්ථා ආයෝජනයෙන් සියයට 35·2 ක් තැනීම් කටයුතු සඳහා විය. යන්ත්‍රාගාර හා යන්ත්‍රසූත්‍ර සඳහා ආයෝජනය මුළු ආයෝජනයෙන් සියයට 40.3 ක් සහ ප්‍රවාහණ උපකරණ සඳහා ආයෝජනය සියයට 13·1 ක් විය. 1970 දී රාජ්‍ය සංස්ථාවල ප්‍රාග්ධන සම්පාදනය රුපියල් දශලක්ෂ 125·0 කින් අඩුවිය. ආයෝජනය පහළ යාම් ප්‍රධාන වශයෙන් වූයේ වෙළඳම, ප්‍රවාහණය, යන්ත්‍රාගාර හා යන්ත්‍ර උපකරණ සහ සේවාවලය. මීට ප්‍රධාන හේතුව වූයේ, ආනයන පරිමාවේ අඩුවීමයි. ආයෝජනයේ වැඩිවීම තැනීම් කටයුතු, කෘෂිකර්මය, කර්මාන්ත හා අනිකුත් ප්‍රාග්ධන භාණ්ඩ සම්බන්ධයෙන් විය.

**පෞද්ගලික අංශය**

පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන සම්පාදනය, වත්කම් වර්ග අනුව බෙදී ගිය අයුරු II (අ) 9 සංඛ්‍යා සටහනේ දැක්වේ. 1970 දී පුද්ගලික අංශයේ මුළු ප්‍රාග්ධන සම්පාදනයෙන් සියයට 60·4 ක් ගොඩනැගිලි සහ අනිකුත් තැනීම් කටයුතු සඳහා විය. යන්ත්‍රාගාර හා යන්ත්‍රසූත්‍ර සඳහා ආයෝජනය සියයට 10·8 ක් සහ ප්‍රවාහණ උපකරණ සඳහා සියයට 13·9 ක් විය. 1970 දී පෞද්ගලික අංශයේ මුළු ආයෝජනය රුපියල් දශලක්ෂ 198 කින් වැඩිවිය. ගොඩනැගිලි හා තැනීම් කටයුතුවල ආයෝජනය රුපියල් දශලක්ෂ 140 කින්ද, යන්ත්‍රාගාර සහ යන්ත්‍රසූත්‍රවල ආයෝජනය රුපියල් දශලක්ෂ 84 කින් වැඩිවූ අතර, ප්‍රවාහණ උපකරණවල ආයෝජනය රුපියල් දශලක්ෂ 63 කින් පහළ වැටුණි. එම වර්ගයේ ආනයනවල පහළ යාම ප්‍රවාහණ උපකරණවල ආයෝජනය පහළ යැමට හේතු විය. 1970 දී පෞද්ගලික අංශයේ ආයෝජනයට වැඩිවීමෙන් සියයට 41·3 ක් ගොඩනැගිලි තැනීම් කටයුතුවල විය. එය පිළිබිඹු වූයේ තැනීම් කටයුතු සඳහා වැඩි වූ ඉල්ලුම සහ ගොඩනැගිලි උපකරණවල වඩා වැඩි සැපයුම තුළිනි.

**දළ දේශීය වියදමෙහි ආනයන සංයුතිය**

මෑත වර්ෂවලදී පෙනී ගිය කැපී පෙනෙන ව්‍යුහමය වෙනස නම්, දළ දේශීය වියදමෙහි ආනයන සංයුතියේ පහළ යාමයි. කලින් ආනයන කරන ලද භාණ්ඩවල දේශීය නිෂ්පාදනය වැඩිවීම මේ උපනතියට ප්‍රධාන හේතුවයි. 13 වැනි පරිශිෂ්ඨ සංඛ්‍යා සටහන, දළ දේශීය වියදමේ ආනයන සංයුතිය දක්වයි. පෞද්ගලික පරිභෝජනයෙහි සෘජු ආනයන සංයුතිය 1968 දී 16.5 ක් සහ 1969 දී සියයට 16·8 ක සිට 1970 දී සියයට 15·5 දක්වා පහත වැටුණි. මි. ර. ගැ. මිල අනුව අගය කළ ප්‍රාග්ධන වියදමේ ආනයන සංයුතිය 1969 දී සියයට 27·1 සිට 1970 දී සියයට 21·2 දක්වා අඩුවිය..